මත් පැන් පානය කළ මිනිසෙකු නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වෙත ගෙන එන ලදී. එතුමා ((නුඹලා ඔහුට පහර දෙන්න.)) යැයි පවසා සිටියහ.

අබූ හුරෙයිරා -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි. සැබැවින්ම මත්පැන් පානය කළ මිනිසෙකු නබි (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) තුමා වෙත ගෙන එන ලදී. එතුමා (නුඹලා ඔහුට පහර දෙන්න) යැයි පැවසූහ. අබූ හුරෙයිරා තුමා
තවදුරටත්: අප අතුරින් තම අතින් පහර දෙන්නන් ද තම පාවහනින් පහර දෙන්නන් ද තම ඇඳුමෙන්
පහර දෙන්නන් ද විය. යැයි පවසා සිටියේය. පසුව ඔහු හැරී ගිය කල්හි ඇතැම් පිරිස්:
අල්ලාහ් ඔබට අවමන් කරත්වා! පැවසීය. එතුමා: (නුඹලා එසේ නොපවසනු. ඔහුට එරෙහිව ඔබ ෂෙයිතාන්ට උපකාර නොකරනු.) [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් බුහාරි එය වාර්තා කර ඇත]

මෙම හදීසයේ තේරුම: නියත වශයෙන්ම සහාබාවරු -රළියල්ලාහු අන්හුම්- නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වෙත මත්පැන් පානය කළ මිනිසෙකු කැඳවා ගෙන එන ලදී. එවිට ඔහුට පහර දෙන්නැයි නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා නියෝග කළහ. එවිට සහාබාවරු ඔහුට පහර දුන්හ. ඔවුන් අතුරින් පිරිසක් පහර දෙන කිසිදු උපකරණයක් භාවිතා නොකර තම අතින් පහර දුන්හ. ඔවුන් අතුරින් තවත් පිරිසක් තම පාවහනින් පහර දුන්හ. එය ඔහුට අවමන් කිරීම පිණිසය. තවත් පිරිසක් තම වස්ත්රයෙන් පහර දුන්හ. පහර දීමේදී දඬුවම් කරන උපකරණයක් ලෙස කසය භාවිතා නොකළහ. තවත් වාර්තාවක එතුමාණෝ විසි දෙනෙකුට නියෝග කළහ. එවිට සෑම පුද්ගලයකුම රට ඉදි අත්තෙන් හා පාවහනින් පහරවල් දෙක බැගින් ඔහුට පහර දුන්හ. කස පහරවල් හතළිහක් ලෙස විස්තර කරනු ලබනුයේ මෙයයි. කුලෆාඋර් රාෂිදීන් හෙවත් මුල් නායකයින් මීට වඩා අමතර පහර දීම් සිදු කර ඇත්තේ ප්රධානියාගේ දැක්මට අනුව අවවාදයක් ලෙසිනි. පසුව ඔහුට පහර දී අවසන් කළ කල්හි ඔවුන් අතුරින් ඇතැමුන් අල්ලාහ් ඔබ අවමානයට පත් කරත්වා යැයි පවසමින් දොස් නැගූහ. එනම්, ජනයා අතර ඔහු අවමානයට පහත් තත්ත්වයට නීචභාවයට පත් වේවා යන්නයි. එවිට නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- නුඹලා ඔහුට එසේ නොපවසනු. ඔහුට එරෙහිව ෂෙයිතාන්ට උදව් නොකරනු. හේතුව ඔවුන් ඔහුට අවමානය පැතුවේ නම් ඇතැම් විට ඔවුනට පිළිතුරු දෙනු ලබනු ඇත. එවිට ෂෙයිතාන් ඔහුගේ ඉලක්කය වෙත ළඟා වෙයි. ඔහු පතන එමෙන්ම ඔහු අරමුණු කළ දෑ ඔහු ලබා ගනියි. එවිට පව්කාරයා ඉන් වැළකී දුරස්ථ නොවනු ඇත.

http://www.sunnah.global/hadeeth/si/show/3262